Please check the examination details below before entering your candidate information

| Candidate surname | Other names |
| --- | --- |
| | |

Centre Number | Candidate Number

# Pearson Edexcel International GCSE (9–1)

## Thursday 13 June 2024

Morning (Time: 2 hours 30 minutes) | Paper reference **4SI1/01**

# Sinhala

## PAPER 1: Reading, Writing and Translation

**You do not need any other materials.**

Total Marks

## Instructions

- Use **black** ink or ball-point pen.
- **Fill in the boxes** at the top of this page with your name, centre number and candidate number.
- There are **three** sections you must answer:
  – Section A Questions 1–4
  – Section B Question 5 and **either** Question 6(a) **or** 6(b) **or** 6(c)
  – Section C Question 7.
- Answer the questions in the spaces provided
  *– there may be more space than you need.*
- You must **not** use a dictionary.

## Information

- The total mark for this paper is 100.
- The marks for **each** question are shown in brackets
  *– use this as a guide as to how much time to spend on each question.*

## Advice

- Read each question carefully before you start to answer it.
- Check your answers if you have time at the end.

*Turn over* ▶


©2024 Pearson Education Ltd.

Pearson

## SECTION A

### Reading

**Answer ALL questions.**

**Write your answers in the spaces provided.**

**Multiple-choice questions must be answered with a cross in a box ☒. If you change your mind about an answer, put a line through the box ☒ and then mark your new answer with a cross ☒. Open-response questions do not have to be written in full sentences and you may respond using single words or phrases.**

**1** පහත සඳහන් පාඨය කියවා එම තොරතුරුවලට අනුව දී ඇති **සිංහල** වාක්‍යවල හිස් තැන් පුරවන්න. වගුවේ ඇති පිළිතුරුවලින් නිවැරදි පදය තෝරා ඊට අදාළ ඉංග්‍රීසි අක්ෂරය ඉදිරියෙන් ඇති කොටුව තුළ ලියන්න.

**ශ්‍රී ලංකාවේ අධ්‍යාපන චාරිකාවක්**

මෙම වසරේ අපේ පාසලේ සිසුන් සංචාරය කරන්නේ ඉන්දියානු සාගරයේ මුතු ඇටය වන ශ්‍රී ලංකාවේ ය. ගුවන් ගමනින් පසු එරට රන්වන් වෙරළ තීරයේ ඔවුන් කෙටි විවේකයක් ගනු ඇත. ඔවුන් දිවයිනේ ගම්බද ප්‍රදේශයක දින හතරක ප්‍රජා ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට නියමිත ය. එම ව්‍යාපෘතිය මගින් ග්‍රාමීය පාසලක යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම ඔවුන්ගේ සැලසුමයි. ඉන්පසු ඔවුන් දිවයිනේ සාරවත් සොබා දහම හා සංස්කෘතික විවිධත්වය ගවේෂණය කරනු ඇත. මෙම අධ්‍යාපන චාරිකාවේ මූලික අරමුණු වන්නේ මහනුවර නගරයේ පිහිටි දළදා මාළිගාවට ගොස් එහි ඉතිහාසය අධ්‍යයනය කිරීම හා බෞද්ධ සංස්කෘතිය අත්විඳීමයි. තවද, මින්නේරිය හා විල්පත්තුව යන ඉතා වැදගත් ජාතික වනෝද්‍යානවල සංචාරය කොට ශ්‍රී ලංකාවට ආවේණික වන ජීවීන් නිරීක්ෂණය කිරීමට බලාපොරොත්තු වේ. මෙම සංචාරය මගින් සිසුන්ට ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය ප්‍රජාවන් පිළිබඳ අවබෝධ කරගැනීමටත්, එහි විවිධ වෘක්ෂලතා සහ සත්ත්ව විශේෂ පිළිබඳ ඉගෙන ගැනීමටත් නව මිතුරන් ඇති කර ගැනීමටත් හැකි වනු ඇත.

DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA

| | | | |
|---|---|---|---|
| **A** ශ්‍රී ලංකාව | **B** නැරඹීම | **C** නූතන | **D** සතුරන් |
| **E** මිත්‍රයින් | **F** මිනිසුන් | **G** පළමු | **H** මාළිගාව |
| **I** නාගරික | **J** සතුන් | **K** සහයෝගය | **L** ග්‍රාමීය |
| **M** දෙවන | | | |

| | | |
|---|---|---|
| **උදාහරණය:** | සිසුන් සංචාරය කරන රට **ශ්‍රී ලංකාව** යි. | *A* |
| **1** (a) | සිසුන්ගේ ......... නවාතැන වෙරළාසන්න ස්ථානයක් වේ. | |
| **1** (b) | සිසුන් ......... ප්‍රදේශයක ව්‍යාපෘතියක් කරනු ඇත. | |
| **1** (c) | සිසුහු පාසලකට ......... දක්වති. | |
| **1** (d) | මහනුවර ......... ට ප්‍රසිද්ධ ය. | |
| **1** (e) | වනෝද්‍යානවල දී ......... නැරඹිය හැකි ය. | |
| **1** (f) | චාරිකා මගින් ......... හඳුනා ගත හැකි ය. | |

**(Total for Question 1 = 6 marks)**

DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA

**2** සන්නිවේදන ක්‍රම ගැන කථා කරන මෙම ළමුන් තිදෙනාගේ ප්‍රකාශ කියවා එම තොරතුරුවලට අනුව පහත වගුව පුරවන්න. නිවැරදි කොටු 8 තුළ එක් කතිරය බැගින් යොදන්න. ඇතැම් වාක්‍යයකට හෝ පුද්ගලයෙකුට කතිර එකකට වඩා තිබිය හැකි අතර ඇතැම් විට එකක්වත් නොතිබිය හැකි ය.

## සන්නිවේදන ක්‍රම

**ධනුෂ්ක**



නූතන ලෝකයේ සඟරා තවමත් ඉතා ජනප්‍රිය වන්නේ ඔබට ඒවා ඕනෑ ම තැනක, දුම්රියක, උද්‍යානයක හෝ බස් රථයක දී කියවිය හැකි බැවිනි. එසේ ම පිටු පෙරළීමෙන් ඔබට අහම්බයකින් රසවත් කතා බොහෝ විට සොයා ගත හැකි ය. මේ විදිහට ගොඩක් දේවල් ඉගෙන ගන්න පුළුවන්. උදාහරණයක් ලෙස, පසුගිය දිනක, ග්‍රහ ලෝක සහ තාරකා පිළිබඳ සිත් ඇදගන්නා සුළු ලිපියක් මට හමු විය.

**හිමායා**



නූතන සන්නිවේදන පද්ධතිය තුළ රූපවාහිනිය හා ගුවන් විදුලිය විශාල කාර්යභාරයක් ඉටු කරයි. මෙම ක්‍රමය මගින් පත්තරවලට වඩා වේගයෙන් ප්‍රවෘත්ති ප්‍රචාරය කළ හැකිය. ප්‍රවෘත්ති ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමේ දී රූපවාහිනිය වඩාත් ඉදිරියෙන් ඇතැයි කීම අතිශයෝක්තියක් නොවේ. මෙය වඩාත් විශ්වාසදායක තොරතුරුවලින් එකක් වන නමුත් සමහර වැඩසටහන් යෞවනයන් සඳහා ඍණාත්මක ව බලපෑමක් ඇති විය හැකිය.

**ප්‍රණීෂා**



සමාජ මාධ්‍ය නවීනත ම සන්නිවේදන මාධ්‍ය වන අතර එය වෙන කවර දාකටත් වඩා වේගයෙන් අන්තර්ගතය බෙදා ගැනීමට බහුල වශයෙන් භාවිත කරනු ලබන සන්නිවේදන ක්‍රමයයි. වෙළඳපොලේ අති නවීන තාක්ෂණය හා මෙවලම් ලෙහෙසියෙන් මිල දී ගැනීමට හැකි නිසාත් අද සන්නිවේදනය සැම කෙනෙකුට විශාල ලෙස විවෘත ව ඇත. අන්තර්ගත නිර්මාණය කරන්නන්ට ඕනෑ ම දෙයක් නිදහසේ පළ කළ හැකි බැවින් සමාජ මාධ්‍ය තුළ සංසරණය වන ඇතැම් ප්‍රවෘත්තිවල අන්තර්ගතයේ නිරවද්‍යතාව ගැන විශ්වාසය තැබිය නොහැක.

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA

| | | ධනුෂ්ක | හිමායා | ප්‍රණීෂා |
|---|---|---|---|---|
| **උදාහරණය:** | සඟරා ගැන සඳහන් කරයි. | ☒ | ☐ | ☐ |
| **A** | ප්‍රවෘත්ති ගැන පවසයි. | ☐ | ☐ | ☐ |
| **B** | වේගවත් සන්නිවේදන ක්‍රම ගැන කථා කරයි. | ☐ | ☐ | ☐ |
| **C** | මුද්‍රිත මාධ්‍ය ගැන කියයි. | ☐ | ☐ | ☐ |
| **D** | වියදම් ගැන සැළකිලිමත් වෙයි. | ☐ | ☐ | ☐ |
| **E** | අසාමාන්‍ය මාතෘකා ගැන කැමැත්තක් දක්වයි. | ☐ | ☐ | ☐ |
| **F** | තොරතුරුවල සත්‍ය අසත්‍යතාව ප්‍රශ්න කරයි. | ☐ | ☐ | ☐ |

**(Total for Question 2 = 8 marks)**

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA

**3** අපේ රටේ ප්‍රකට ක්‍රීඩිකාවක් පිළිබඳ පහත සඳහන් ලිපිය කියවන්න. ඊට පහතින් දී ඇති වාක්‍යවල හිස් තැන් **සිංහල** වචන යොදා පුරවන්න.

**අපේ පුංචි මල්ලවපොර ශූරිය**

නෙත්මි අහිංසා ශ්‍රී ලංකාවේ ජනප්‍රිය හා ආදර්ශමත් ක්‍රීඩිකාවක් මෙන් ම ලාබාලතම පදක්කම්ලාභියා ද වේ. 2022 වර්ෂයේ එක්සත් රාජධානියෙහි පැවති පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙලේ දී ඕස්ට්‍රේලියානු තරඟකාරිය පරදවා එතරම් ජනප්‍රිය නොවන ක්‍රීඩාවකින් ඇය ලෝකඩ පදක්කම්ලාභිනිය බවට පත්වූවා ය. ඇය කාන්තා කිලෝ ග්‍රෑම් 57 නිදහස් ආර මල්ලවපොර ඉසව්වට සහභාගි වී තාක්ෂණික විශිෂ්ටත්වයකින් එම ජයග්‍රහණය තහවුරු කළා ය.

ඇය පෙරළා ශ්‍රී ලංකාවට පැමිණි අවස්ථාවේ ක්‍රීඩා අමාත්‍යාංශය හා මල්ලවපොර සම්මේලනය නියෝජනය කරමින් එහි නිලධාරීහු ඇය මව්බිමට පිළිගැනීම සඳහා ගුවන් තොටුපළට පැමිණ සිටියහ. නෙත්මි ක්‍රීඩාවෙන් ලද ජයග්‍රහණය ගැන මහත් ආඩම්බරයට පත් ව සිටින්නී ය.

ඇය පුහුණු වීම් ආරම්භ කරන විට මෙට්ටය වැනි මූලික උපකරණ ඇය සතුව නොතිබුණත් පසු ව ඒවා ලබා ගැනීමට ජාතික සම්මේලනයේ සහාය ඇයට ලැබුණි.

ඇගේ පියා පෙදරේරුවෙකු වුවත් ආර්ථික අපහසුතා මධ්‍යයේ සිට ඇයට අවශ්‍ය කරන සෑම දෙයක් ම සපයා දුන්නේ ය. පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙලේ දී ඈ ලබා ගත් ජයග්‍රහණයෙන් අනතුරුව, තමන්ට ක්‍රීඩාවේ යෙදීමට සහයෝගය ලබා දීම සම්බන්ධයෙන් ඇය තම දෙමාපියන්ට ස්තුතිය පිරිනැමූ අතර තමන්ට පුහුණුව, පෝෂණය හා අනෙකුත් අවශ්‍යතා සපයා දීම වෙනුවෙන් තම පුහුණුකරුට කෘතගුණවේදීත්වය ප්‍රකාශ කළා ය. ඇය දැනට ඔලිම්පික් තරඟ සඳහා උද්‍යෝගයෙන් සූදානම් වෙමින් සිටින්නී ය. ඇය විසින් රටට දායාද කළ කීර්තිය වෙනුවෙන් ඇයට නව නිවසක් ඉදි කර දීමට සංවිධානයක් ඉදිරිපත් ව ඇත.

DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA

**උදාහරණය:** මෙම තරුණියගේ නම ....... **නෙත්මි අහිංසා** ....... නම් වේ.

(a) නෙත්මි තරුණ පරම්පරාවට ....................................... කි. **(1)**

(b) නෙත්මි ....................................... පදක්කම ජයග්‍රහණය කළේ .......................................
දක්ෂතාව නිසා ය. **(2)**

(c) තරඟවලට අනුග්‍රහය දැක්වූ රට ....................................... යයි. **(1)**

(d) නෙත්මිට ගුවන් තොටුපළේ දී උණුසුම් ....................................... ලැබුණු අතර ඇය තමා
ලබා ගත් ජයග්‍රහණය ගැන ....................................... වන්නීය. **(2)**

(e) නෙත්මි පුහුණුවීම් අරඹන විට ඇයට ....................................... නොතිබුණි. **(1)**

(f) ....................................... ගැන නෙත්මි තම දෙමාපියන්ට ස්තුතිවන්ත වෙයි. **(1)**

(g) ....................................... හා ....................................... නිසා නෙත්මි තම පුහුණුකරුව
අගය කරයි. **(2)**

(h) නෙත්මිගේ ඊළඟ මහා තරගය ....................................... . **(1)**

(i) නෙත්මිට තෑගි වශයෙන් ....................................... ලැබෙනු ඇත. **(1)**

**(Total for Question 3 = 12 marks)**

DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA

**4** දර්ශනා ශම්මි විජේතිලක මහත්මිය විසින් ලියන ලද **"අසනග වැසි"** නමැති කෘතියෙන් උපුටා ගන්නා ලද පහත සඳහන් ඡේදය කියවන්න.

**අම්මාගේ ආදරය**

"දරුවො ඉස්කෝලෙට ඇතුල් කරන්නේ ජනවාරි මාසෙ. මේ දෙසැම්බර් මුල් සතිය. වසුන්දරා සීරුවට අත් බෑගය ඇරල චෙක්පොත අරගෙන රුපියල් පන්සීයක චෙක්පතක් ලිව්වා. දරුවන්ගෙ පහසුකම් ගාස්තුවලට රුපියල් තුන්සීයක්. ඉතිරි මුදල පල්ලියේ ඕනෑකමට ගන්න කියල චෙක්පත ගෞරව පූර්වක ව පාදිලි උන්නාන්සෙට දුන්නා. පළවෙනි වාරෙ නිවාඩු දෙනකම් ම සතිඅන්තෙවත් දරුවන් ගෙදර යවන්න බැරි බව පියතුමා සඳහන් කළේ නේවාසික පාසල් ජීවිතයට දරුවන් හුරු කළ යුතු නිසයි. පල්ලියෙ ඉස්කෝලෙ ඉගැන්නුවෙ ඉංග්‍රීසියෙන් හින්දා දරුවන් ඊට හුරු වෙන්න නම් නේවාසික වීම අනිවාර්ය බව පියතුමා තවදුරටත් පැහැදිළි කළා.

ගෙදරදි සිංහල උගන්වන්න පුළුවන් හින්දා වසුන්දරා ඒකට කැමති වුණා. දැන උගත්කම දරුවෙකුට ඕනමයි කියන තැන වසුන්දරා ඉන්නවා. වසුන්දරා එන්න එන්න ම කාර්ය බහුල වෙනවා. දරුවන් ඇගේ ජීවිතයේ ම කොටසක් කරගෙන තමන්ගෙ ඇහේ දමාගෙන රකින්නේ.

දරුවන්ගෙ තාත්තා රවිනාථ වතු දෙකක අයිතිකාරයෙක්. කාර්ය බහුල වීම නිසා ගෙදර රැඳෙන්නෙ ම නැති ගානයි. මේ අතරවාරයේ වැවිලිකරුවන්ගේ සංගමයේ සභාපතිකමත් රවිනාථගෙ පිට පැටවිලා නිසා දැන් රවිනාථට විවේකයක් ඇත්තෙ ම නැහැ.

දරුවන්ගෙ වැඩයි ගෙදර වැඩයි ඔක්කොම රාජකාරි බාර වසුන්දරාට. ඇය හැමදේ ම වගකීමෙන් ඉටු කළා. මහත්තයයි දරුවොයි ගෙදර නැතුව බංගලාව පාළුවට ගිහින් වගේ වසුන්දරාට දැනෙන්නෙ. පාළුව මගහරවා ගන්න වසුන්දරා මිදුලෙ කොනක තිබුන පරණ ගබඩා කාමරේක වත්තෙ තරුණ ගැහැණු ළමයින්ට මහන්නයි, රේන්ද ගොතන්නයි ඉගැන්නුවා. අකුරු බැරි අයට අකුරු ලියන්නත් ඉගැන්නුවා. ඔක්කොම දේවල් උගන්නන්න ඉන්නෙ එක ගුරුවරියයි. ඒ වසුන්දරා. වසුන්දරාගෙ කරුණාවන්තකම හැමෝම දන්නෙ නැහැ. බැලූ බැල්මට පේන්නෙ මාන්නාදිකකමින් පිරුණ වලව්වක ළමාතැනී කෙනෙක් වගේ. ඒත් කථාබහ කරන කොට තමයි තේරෙන්නෙ හිතේ තියෙන මුදු ගතිය."

DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA

**4** (a) පාඨයේ ඇති තොරතුරුවලට අනුව අසා ඇති ප්‍රශ්නවලට **සිංහලෙන්** පිළිතුරු සපයන්න. පිළිතුරු සඳහා සම්පූර්ණ වාක්‍ය ලිවීම අවශ්‍ය නොවේ.

(i) ජනවාරි මාසයේ සිදුවන්නේ කුමක් ද?

**(1)**

..............................................................................................................................................

(ii) පාසලේ නේවාසික ව සිටීම හොඳ ම අදහස යැයි පූජකයා සිතන්නේ ඇයි? කරුණු **දෙකක්** ලියන්න.

**(2)**

..............................................................................................................................................

..............................................................................................................................................

(iii) වසුන්දරා ආගමට ළැදි කෙනෙක් බව ඔබ දන්නේ කෙසේ ද?

**(1)**

..............................................................................................................................................

(iv) වසුන්දරා තම දරුවන් ගෙදර සිටින විට ඔවුන් වෙනුවෙන් කරන්නේ කුමක් ද? කරුණු **දෙකක්** ලියන්න.

**(2)**

..............................................................................................................................................

..............................................................................................................................................

(v) රවිනාථට තම දරුවන් වෙනුවෙන් කාලය ගත කිරීමට ඇති බාධක මොනවා ද? හේතු **දෙකක්** ලියන්න.

**(2)**

..............................................................................................................................................

..............................................................................................................................................

(vi) වසුන්දරා ප්‍රජාව වෙනුවෙන් ඉටු කළ කාර්යයක් ගෙනහැර දක්වන්න.

**(1)**

..............................................................................................................................................

(vii) වසුන්දරාගේ බාහිරින් නොපෙනෙන ගුණාංගය කුමක් ද?

**(1)**

..............................................................................................................................................

DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA

**4** (b) මෙම පාසල් ළමුන් දෙදෙනා අතර කෙරන පහත සඳහන් සංවාදය කියවා අසා ඇති ප්‍රශ්නවලට **සිංහලෙන්** පිළිතුරු සපයන්න.

ෆවුසි
මම හිතන විදිහට ප්‍රජාවන් එක හා සමාන වටිනාකම් හා එක වාගේ චාරිත්‍ර වාරිත්‍ර බෙදා හදා ගන්නවා. ග්‍රාමීය ප්‍රජාවක හෝ නාගරික ප්‍රදේශයක හෝ කුමන ස්ථානයක ජීවත් වුවත් ප්‍රජාවකට ඒ තුළ ශක්තිමත් සමාජ බලපෑමක් තිබෙනවා. ඔවුන් කිසියම් නිශ්චිත භූමි භාගයක ජීවත් වන්නේ නම් එම ප්‍රජාව තුළ ඇති බැඳීම් වඩාත් ශක්තිමත් වෙනවා. ප්‍රජාවක් යනු පොදු හුරු පුරුදු, සම්ප්‍රදායන්, ආගමික විශ්වාස හා ඔවුන් පරිභෝජනය කරන ආහාර පාන වැනි ඔවුන්ට ම පොදු වූ පුරුදු රාශියකින් සමන්විත සමාජ කණ්ඩායමක් ලෙස හඳුන්වන්න පුළුවන්.

කෙසේ වෙතත්, මට හිතෙන විදිහට සමාජයේ පවුල්වල ඇති වැදගත් ම අංගය වන්නේ ආදරය සහ කොන්දේසි විරහිත ව පවතින බන්ධනයයි. අප කවුරුත් හොඳින් දන්නා පරිදි, රුධිරය ජලයට වඩා ඝනකමින් යුක්ත යි. දෙමාපියන් හා දරුවන් අතර ඇති ඥාති සම්බන්ධය බොහෝ විට ලෝකයේ ඇති ශක්තිමත් ම බන්ධනයයි. මගේ දෙමාපියන් මා වෙනුවෙන් ඕනෑ ම දෙයක් කිරීමට පසුබට වෙන්නේ නෑ. ඔවුන් මගෙන් කිසිවක් ආපසු බලාපොරොත්තු නොවී මුළු ජීවිත කාලය ම මා වෙනුවෙන් කැප කරනවා. අපේ පවුලේ මත භේද ඇති වන අවස්ථාවල දී පවා ඒවා විසඳා ගැනීමට අපි මාර්ග සොයා ගන්නවා.

මාලා
මට මගේ ආච්චිලා හා සීයලා එක්ක පුදුම සම්බන්ධයක් තියෙනවා. මගේ අම්මයි තාත්තයි දෙන්නා හැමදාම රාජකාරියට යන නිසා මම ඉස්කෝලේ ඇරිලා ගෙදර එන කොට මගේ කෑම හදන්නෙත්, ගෙදර වැඩවලට උදව් උපකාර කරන්නෙත් මගේ ආච්චි අම්මා. ආච්චි අම්මා සහ සීයා මට මගේ භාෂාව සහ සංස්කෘතිය ගැන බොහෝ වැදගත් දේවල් කියලා දෙනවා.

මම හිතන්නේ දැන් සමාජය වෙනස් වෙමින් පවතින නිසා මගේ අම්මා හා තාත්තා වැනි අය රැකියාවලට යන නමුත් එහි ධනාත්මක ලක්ෂණය වන්නේ ඔවුන් නිවසට වැඩිපුර මුදලක් ගෙන ඒම මෙන් ම පවුල තුළ සම්ප්‍රදායන් ජීවමානව තබා ගැනීමයි. එමෙන් ම, මා වැනි තරුණ අයට වැඩිහිටියන්ට පාඩම් ඉගැන්විය හැකියි. උදාහරණයක් ලෙස, දුරකථන සහ පරිගණක භාවිත කරන්නේ කෙසේ දැයි කියා දිය හැකියි.

(i) පළමු කථිකයාගේ අදහස් සාරාංශ කරන්න.

- ප්‍රජාවක ඇති පොදු ලක්ෂණයක්: **(1)**
- ෆවුසිගේ දෙමාපියන් ඔහුට දැක් වූ ආදරය: **(1)**

..........................................................................................................................................

..........................................................................................................................................

(ii) දෙවන කථිකයාගේ අදහස් සාරාංශ කරන්න.

- මාලාගේ සීයාගේ බලපෑම: **(1)**
- මාලාගේ මවගේ රැකියාවේ ධනාත්මක අංගයක්: **(1)**

..........................................................................................................................................

..........................................................................................................................................

**(Total for Question 4 = 14 marks)**

**TOTAL FOR SECTION A = 40 MARKS**

DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA

DO NOT WRITE IN THIS AREA

## SECTION B

### Writing

Answer Question 5 and **either** Question 6(a) **or** 6(b) **or** 6(c).

**Write your answers in the spaces provided.**

**5**

**පාසල් ජීවිතය**

පාසලේ ඔබ වඩාත්ම කැමති දේවල්

ඔබේ පාසලේ දිනපතා කටයුතු

පාසලේ ඔබ ගත කළ අවසන් දින කිහිපය

ශිෂ්‍ය ශිෂ්‍යාවන් දකින්නට කැමති වෙනස්කම්

වචන 85ක් පමණ භාවිත කරමින් ඔබේ පාසල් ජීවිතය ගැන **සිංහල** වාක්‍ය රචනයක් ලියන්න. ඉහත සඳහන් වචන සියල්ල ම භාවිත කළ යුතු ය.

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................

........................................................................................................................................


**(Total for Question 5 = 14 marks)**

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA

**6** පහත සඳහන් විකල්ප තුනෙන් එකක් තෝරාගෙන වචන 145ක පමණ **සිංහල** වාක්‍ය රචනයක් ලියන්න. ඔබ තෝරාගත් විකල්පයට අදාළ ව පිළිතුරු සපයන්න.

## පළමු විකල්පය

(a)



වන සතුන් ආරක්ෂා කිරීමේ ඇති අගය පැහැදිලි කරමින් දේශීය ප්‍රවෘත්ති සඟරාවක පළ කිරීම සඳහා ලිපියක් ලියන්න. ඔබේ ලිපියේ පහත සඳහන් කරුණු ඇතුළත් විය යුතුය.

- සත්තු ආරක්ෂා කරගැනීමේ වටිනාකම
- ගත වූ වසර කිහිපය තුළ හටගත් වන ජීවීන්ට සම්බන්ධ ගැටලු
- වන ජීවීන්ගේ ආරක්ෂාව වෙනුවෙන් ගත හැකි අනාගත ක්‍රියා මාර්ග

**(26)**

## දෙවන විකල්පය

(b)

වටිනා ස්ථාන කිහිපයක් හඳුනා ගැනීමට යා යුතු මග විස්තර කරමින් ඔබේ නගරය නැරඹීමට අවශ්‍යව ඇති ඔබේ ඥාති සොහොයුරෙකුට ලිපියක් ලියන්න. ඔබේ ලිපියේ පහත සඳහන් කරුණු ඇතුළත් විය යුතුය.

- නගරයේ නැරඹීමට ඇති වටිනා ස්ථාන
- අතීතයේ ඔබ නරඹා ඇති ස්ථාන
- නගරය තුළ සංචාරක කර්මාන්තය දිරිගැන්වීමට ගත හැකි අනාගත ක්‍රියා මාර්ග

**(26)**



DO NOT WRITE IN THIS AREA

## තෙවන විකල්පය

(c) පාසල හමාර වීමෙන් පසු පැවැත්වෙන මිතුරු සමාජයකට සම්බන්ධ වීම ගැන මිතුරෙකුට විද්‍යුත් තැපෑලක් ලියන්න. ඔබේ තැපෑලේ පහත සඳහන් කරුණු ඇතුළත් විය යුතුය.

- ඔබ පසුගිය වසරේ සහභාගි වූ මිතුරු සමාජය
- එම සමාජයේ ඇති ඔබ වඩාත්ම කැමති ක්‍රියාකාරකම
- ඔබ එකට එකතු වී කිරීමට කැමති ක්‍රියාකාරකම්

**(26)**

**Indicate which question you are answering by marking a cross ☒. If you change your mind, put a line through the box ☒ and then indicate your new question with a cross ☒.**

Chosen question number: **Question 6(a)** ☒ **Question 6(b)** ☒ **Question 6(c)** ☒

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA



P 7 5 5 6 0 A 0 1 4 2 0

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA

**(Total for Question 6 = 26 marks)**

**TOTAL FOR SECTION B = 40 MARKS**

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA

DO NOT WRITE IN THIS AREA

## SECTION C

### Translation into Sinhala

**Write your answer in the space provided.**

**7** පහත සඳහන් ඡේදය **සිංහලට** නගන්න.

The Central Bank of Sri Lanka is the only authority that can issue money in the country. Adults can educate children about the importance of using them sensibly. To ensure that currency in circulation are of good quality, they need to be kept in the wallet without folding or crumpling and should not be touched with dirty hands. A special container can be maintained at home to keep coins received in daily transactions. Clean notes can build a good image of a nation. However, paying with notes is out of fashion as society is driven towards becoming cashless.

**(20)**

**(Total for Question 7 = 20 marks)**

**TOTAL FOR SECTION C = 20 MARKS**
**TOTAL FOR PAPER = 100 MARKS**

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA

**BLANK PAGE**



P75560A01920

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA

**BLANK PAGE**

**Source information**

**Question 2**
© Jaromir Chalabala/Shutterstock
© Anthony Asael/Art in All of Us/Contributor/Getty Images (RM)
© hadynyah/Getty Images (RF)

**Question 6**
© Ingrid Heres/Shutterstock